# The significance of Situational Language Teaching Method at the Tertiary Level ESL Classroom

**D. G. Amarasinghe**

භාෂාව සැමවිට ඇති වන්නේ යම් සමාජ පසුබිමක් පදනම් කොටගෙන බැවින් භාෂාව ඉගැන්වීමේ දී එය එකී සමාජ පසුබිමෙන් වෙන් නොකළ යුතු ය. අවස්ථානුකූල ඉගැන්වීමේ ක්‍රමෝපාය (Situational Teaching Method) මෙම පදනමේ සිට ව්‍යාකරණානුකූල විෂය නිර්දේශය වෙනුවට වඩා ප්‍රායෝගික ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රමයක් සපයයි.

මෙම අධ්‍යයනය ආශ්‍රයෙන් අවස්ථානුකූල ව ඉගැන්වීමේ ක්‍රමෝපාය කෙතරම් දුරට ශ්‍රී ලංකාවේ තෘතීක අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි දෙවන බසක් ලෙස ඉගැන්වීමේ පන්ති කාමරය සඳහා ගැළපේ ද යන්න පිළිබඳ ව සලකා බැලෙයි. විශේෂයෙන් ම මෙම කෘතිය ආශ්‍රයෙන් මෙය පූර්ණ විෂය නිර්දේශයක් ලෙස (අවස්ථානුකූල ව විෂය නිර්දේශය) නොව ඉගැන්වීමේ ක්‍රමවේදයක් ලෙස (අවස්ථානුකූල ව ඉගැන්වීමේ ක්‍රමවේදය) ගත් කළ එයින් ඉංග්‍රීසි දෙවන බසක් ලෙස හෝ විදෙස් බසක් ලෙස ඉගැන්වීම සඳහා ඇති වන විපුලඵල මෙයින් අධ්‍යනය කෙරෙයි. මෙය අධ්‍යයනය කෙරෙනුයේ විවිධ සාධන මට්ටම් සඳහා කෙතරම් දුරට මෙම ක්‍රම වේදය ගැළපේ ද සහ ඒ ඒ සාධන මට්ටමෙහි ශිෂ්‍යයින්ගේ මෙම ක්‍රමවේදය සඳහා ඇති කැමැත්ත සලකා බැලීමෙනි. සාධන මට්ටම අනුව වර්ගීකරණය කළ සහභාගිවන්නන්ට උගන්වන ලද පාඩමක් ආශ්‍රිත ව පර්යේෂණ උපකරණයක් සපයන ලදී.

© D. G. Amarasinghe
සංස්. ආචාර්ය පූජ්‍ය හිඟුරේ ආරියානන්ද හිමි, මහාචාර්ය ඒ.ඩී. පෙරේරාන්විල, මහාචාර්ය ප්‍රසන්න කොඩිප්පිලි, ප්‍රියංකර රත්නායක
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 18 කලාපය, 2012/13, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය